ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී
උපාධි වැඩසටහන 2023/2024
6 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2024

**SNE6546/ESE6246 -අන්තර්කරණ පන්තිකාමරවල සිටින සිසුන් සඳහා විෂයමාලා සංවර්ධනය සහ අනුවර්තනය**

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2025.03.08 වේලාව -ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. "විෂයමාලා අනුවර්තනය" ඔබේ වචනයෙන් අර්ථ දක්වන්න.

02. ඉගෙනුම සඳහා විශ්වීය ආකෘතිය (Universal Design for Learning - UDL) මඟින් අන්තර්කරණ පන්ති කාමරයක විවිධත්වයෙන් යුතු ඉගෙනුම්ලාභීන්ට සහාය වන ආකාර පහක් (05) ලැයිස්තුගත කරන්න.

03. විෂයමාලා අනුවර්තනයේ ප්‍රධාන ආකාර දෙක (02) සඳහන් කර ඒවා උදාහරණ සමඟ කෙටියෙන් පැහැදිලි කරන්න.

04. වර්තමාන පන්ති කාමරවල සිසුන්ට ඉගැන්වීමේදී "එකම ප්‍රමාණය සියල්ලටම නොගැලපේ" යන අදහසට සහාය වන කරුණු පහක් (05) සඳහන් කරන්න.

05. "අන්තර්කරණ පන්ති කාමරයක් තුළ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිසුන්ගේ 'ඉගෙනුම් පැතිකඩ' ගුරුවරුන්ට වැදගත් වේ." ශිෂ්‍යයකුගේ ඉගෙනුම් පැතිකඩට ඇතුළත් කළ යුතු ප්‍රධාන අංග පහක් (05) නම් කරන්න.

06. අන්තර්කරණ පන්ති කාමරයක් තුළ ක්‍රියාත්මක කළ හැකි ඉගැන්වීම විවිධාංගීකරණ ක්‍රම සඳහන් කරන්න.

07. අන්තර්කරණ පන්ති කාමරවලදී ඉගෙනීම සඳහා සිසුන්ගේ සහභාගීත්වය වැඩි කිරීම වෙනුවෙන් භාවිත කළ හැකි උපාය මාර්ග පහක් (05) ලැයිස්තු ගත කරන්න.

08. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ට ඉගැන්වීම සඳහා ගුරුවරුන්ට විගොට්ස්කියේ (Vygotsky) උපරි සංවර්ධන කලාප (ZPD) න්‍යාය යොදා ගත හැක්කේ කෙසේද? උදාහරණ පහක් (05) සපයන්න.

## 02 වන කොටස

09. (i.) අන්තර්කරණ පන්ති කාමරයක ළමුන් අතර පාසල හැරයාමේ අනුපාතය අඩු කිරීම සඳහා අවධානය යොමු කළ යුතු අධ්‍යයන කුසලතා පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) අන්තර්කරණ පන්ති කාමරයක විෂයමාලා අනුවර්තනයෙහි වැදගත්කම විස්තර කරන්න. ඔබේ කරුණු දැක්වීමට උදාහරණ සපයන්න. (ලකුණු 07)

(iii.) අන්තර්කරණ පන්ති කාමර ගුරුවරයෙකු ලෙස, ශ්‍රී ලංකාවේ අන්තර්කරණ පන්ති කාමර සන්දර්ශය තුළ ඔබට විෂයමාලා අනුවර්තනය භාවිත කළ හැක්කේ කෙසේද? ඔබේ පිළිතුරට සහය වීමට සුදුසු උදාහරණ සපයන්න. (ලකුණු 08)

10. (i.) අන්තර්කරණ පන්ති කාමරයක, පන්ති කාමර විවිධත්වය සහ "ඉගැන්වීම විවිධාංගීකරණය" අතර සම්බන්ධතාවයේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් සඳහා ඉගැන්වීම විවිධාංගීකරණයේදී ගුරුවරුන් මුහුණ දෙන අභියෝග විස්තර කරන්න. (ලකුණු 06)

(iii.) අන්තර්කරණ පන්ති කාමර ගුරුවරයෙකු ලෙස, දෙමාපියන්ගේ සහ පාසල් ප්‍රජාවේ සහය ඇතිව ඉහත සඳහන් අභියෝග ජය ගන්නේ කෙසේද? (ලකුණු 08)

11. (i.) "පාසල් පද්ධතිය තුළ ඉගෙනීම සඳහා විශ්වීය ආකෘතිය" යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 04)

(ii.) ඉගෙනීම සඳහා විශ්වීය ආකෘතියේ ප්‍රධාන මූලධර්ම කෙටියෙන් පැහැදිලිකර, අන්තර්කරණ පන්ති කාමරය තුළ මෙම ප්‍රධාන මූලධර්ම අත්‍යවශ්‍ය වන්නේ මන්දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 07)

(iii.) ඔබේ අන්තර්කරණ පන්ති කාමරය තුළ ඔබ උගන්වන පාඩමක් තෝරාගෙන, තෝරාගත් පාඩම සඳහා ඉගෙනීම සඳහා විශ්වීය ආකෘතියේ ප්‍රධාන මූලධර්ම ඔබ අදාළ කරගන්නේ කෙසේද යන්න විස්තර කරන්න. (ලකුණු 09)

12. (i.) සිසුන්ගේ ඉගෙනුම් ශෛලීන් උදාහරණ සමඟ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) සිසුන්ගේ විවිධ ඉගෙනුම් ශෛලීන් ඔවුන්ගේ උපරිම විභවය වැඩි දියුණු කරන ආකාරය පැහැදිලි කරන්න. උදාහරණ සපයනස්න. (ලකුණු 07)



58

(iii.) ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිසුන්ගේ රුචිකත්වයට ආමන්ත්‍රණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ අන්තර්කරණ පන්ති කාමරවල ඇති අවස්ථා සහ බාධක මොනවාද? උදාහරණ සපයන්න. (ලකුණු 08)

13. (i.) විෂයමාලා අනුවර්තනයන් පහසු කිරීමේදී සහයක තාක්ෂණයේ කාර්යභාරය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) අන්තර්කරණ පන්ති කාමරයේ දී විෂයමාලා අනුවර්තනය නොකිරීමේ ප්‍රතිවිපාක විස්තර කරන්න. (ලකුණු 07)

(iii.) අන්තර්කරණ පන්ති කාමරයක ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී ඩිස්කැල්කියුලියා තත්ත්වය සහිත සිසුන් සඳහා ඔබ පහසුකම් සලසන්නේ කෙසේද යන්න පරීක්ෂා කරන්න. (ලකුණු 08)

14. "පන්ති කාමර වාතාවරණය හෝ ඉගෙනුම් පරිසරය සිසුන්ගේ ඉගෙනීම, අවධානය, හැසිරීම සහ අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනැගීමේ හැකියාවට සැලකිය යුතු ලෙස බලපෑ හැකිය."

(i.) "අන්තර්කරණ ඉගෙනුම් පරිසරය" නිර්වචනය කරන්න. (ලකුණු 05)

(ii.) අන්තර්කරණ පන්ති කාමරයක මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීමේදී සලකා බැලිය යුතු වැදගත් සාධක උදාහරණ සපයමින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii.) අන්තර්කරණ පන්ති කාමරයක විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් සඳහා ගුරුවරුන්ට, බ්ලූම්ගේ වර්ගීකරණය යොදා ගතහැකි ආකාරය පරීක්ෂා කරන්න.

(ලකුණු 08)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*



59